# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: (94)-011-2484500, (94)-011-2484600, (94)-011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: (94)-011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No: PFD/MPD/Domestic/Cir.03/2020
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2021.01. 11

**රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2020 (i)**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ දිස්ත්‍රික් ලේකම්වරුන්,
පළාත් පාලන ආයතන ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ
රජය සතු සමාගම්වල සභාපතිවරුන්,

**දේශීය කර්මාන්ත දිරිගැන්වීමේ ප්‍රතිපත්තිය**

උක්ත කරුණට අදාලව නිකුත් කරන ලද 2020.10.09 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2020 හි 3 ඡේදය යටතේ වන 3.1 iii (ආ), iv හා v අනුඡේදයන් පහත පරිදි සංශෝධනය කෙරේ.

" 3.1. **ඉදිකිරීම් කර්මාන්තය;**

iii. ආ) (i) ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 150ට වැඩි හා රුපියල් මිලියන 300 දක්වා වන කොන්ත්‍රාත් සඳහා මිල කැඳවීම් වලදී, CIDA මගින් පිළිගත් අනුරූපී ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් සිමාවන් මත පදනම්ව, CIDA C3 හා C2 ශ්‍රේණිවල ලියාපදිංචි දේශීය සමාගම්[1](උපදේශකවරුන් සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්) වලින් පමණක් මිල ගණන් කැඳවනු ඇත.

ආ) (ii) ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 300 ට වැඩි හා රුපියල් මිලියන 600 දක්වා වන කොන්ත්‍රාත් සඳහා මිල කැඳවීම් වලදී, CIDA මගින් පිළිගත් අනුරූපී ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් සිමාවන් මත පදනම්ව, CIDA C2 හා C1 ශ්‍රේණිවල ලියාපදිංචි දේශීය සමාගම්[1] (උපදේශකවරුන් සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්) වලින් පමණක් මිල ගණන් කැඳවනු ඇත.

---

[1] "දේශීය බහුතර හිමිකාරිත්වයක් සහිත ආයතන, ස්වදේශීය ආයතන හෝ දේශීය සමාගමක්" යනු ශ්‍රී ලාංකිකයින් විසින් සියයට 51 කට වැඩි හිමිකාරිත්වයක් දරනු ලබන සහ ශ්‍රී ලංකාවේ අදාළ අධිකාරියක් යටතේ එහි මුල් ලියාපදිංචිය සිදුකර ඇති ආයතනයක් වන අතර මෙම ලේඛණය සඳහා සමස්ථයක් වශයෙන් මෙම අර්ථ දැක්වීම අදාළ වේ.

iv. මෙම කර්මාන්ත සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යවසායන්හි කාර්යභාරය සැලකීමේදී, එකී රාජ්‍ය ව්‍යවසායන් විසින් තරඟකාරී මිල කැඳවීම් සඳහා මිල ගණනක් ඉදිරිපත් කර ඇති විට, එම රාජ්‍ය ව්‍යවසායන් සඳහා අනෙකුත් කොන්ත්‍රාත්කරුවන්ට වඩා සියයට 5ක විශේෂ වරණයක් ලබා දෙනු ඇත. මෙම වරණය තාක්ෂණික ඇගයීමේදී නොව මූල්‍ය ඇගයීමේදී පමණක් ලබා දෙනු ඇත.

v. අසාමාන්‍ය ලෙස මිල උච්චාවචනයන් සහිත ලංසු ඉදිරිපත් වීම වැලැක්වීම තහවුරු කිරීම සඳහා පහත නිර්ණායක වලට අනුගත විය යුතු ය.

අ) ලංසු මිල, ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 11 සිට සියයට 19 දක්වා අඩු වන අවස්ථාවලදී කාර්ය සාධන සුරක්ෂණය 5% කින් වැඩි කල යුතු ය.

ආ) ලංසු මිල, ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 20 සිට සියයට 29 දක්වා අඩු වන අවස්ථාවලදී කාර්ය සාධන සුරක්ෂණය 10% කින් වැඩි කල යුතු ය.

ඇ) ලංසු මිල, ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 30 හෝ ඊට වැඩි ප්‍රතිශතයකින් අඩු වන අවස්ථාවලදී එම ලංසුව ප්‍රතික්ෂේප කල යුතු ය. ”

එස්. ආර්. ආටිගල
භාණ්ඩාගාර ලේකම්

පිටපත්:
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති